# ජාතික අධ්‍යාපන ආයතනය

## අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව 2021

## Diploma in Additional Language Improvement Program 2021

## සිංහල/දෙමළ/ඉංග්‍රීසි

ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පාඨමාලාලාභීන් බඳවා ගනු පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

ප්‍රවේශ සුදුසුකම්

- අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම.

  **සහ**

- රජයේ පාසලක/ රජයේ අනුමත පෞද්ගලික පාසලක, ගුරුවරයකු/ විදුහල්පතිවරයකු/ පිරිවෙන් ගුරුවරයකු/ පරිවේණාධිපතිවරයකු/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ/විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු/ කොට්ඨාස/ කලාප/පළාත් අධ්‍යාපන කාර්යාල හා අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වීම.

පාඨමාලාවේ ස්වභාවය

- සිංහල මාධ්‍ය අයදුම්කරුවන් සඳහා දෙමළ භාෂා පාඨමාලාවක් ද දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් සඳහා සිංහල භාෂා පාඨමාලාවක් ද ඊට අමතරව ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් ද පැවැත්වේ.
- මෙය සති අන්ත හා පාසල් නිවාඩු කාලවල දී පවත්වනු ලබන අර්ධ කාලීන පාඨමාලාවක් වන අතර පාඨමාලා කාලය අවුරුද්දකි.
- මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දේශන පැවැත්වේ.

පාඨමාලා ගාස්තු

අයදුම් කිරීමේ ගාස්තුව රු. 500/= කි. ලියාපදිංචි ගාස්තුව රු. 1,000/= කි. පාඨමාලා ගාස්තුව රු. 30,000/= ක් වන අතර එය වාරික දෙකකින් වුවද ගෙවිය හැකි ය. පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී ලියාපදිංචි ගාස්තුව හා පළමු වාරිකය වන රු. 15,000/= හෝ සම්පූර්ණ පාඨමාලා ගාස්තුව ගෙවිය යුතු ය. වාරික දෙකකින් ගෙවන්නේ නම් දෙවන වාරිකය පාඨමාලාව ආරම්භ කර තෙමසක් තුළ ගෙවා නිම කළ යුතු වේ. එයට අමතරව අවසාන විභාගය පැවැත්වීමට පෙර විභාග ගාස්තු සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ යුතුය.

අයදුම් කිරීම

2021 ඔක්තෝබර් 30 දිනට පෙර ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියේ (www.nie.lk) ඇති පහත සඳහන් ලින්ක් එක ක්ලික් කර Google Form පත්‍රය පුරවා ඔබගේ අයදුම්පත යොමු කරන්න.

https://forms.gle/CjnfNhcuJ1mzxuEw5

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය